# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,953 - 2016 පෙබරවාරි මස 05 වැනි සිකුරාදා - 2016.02.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 194 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 194 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 199 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 පෙබරවාරි මස 26 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 පෙබරවාරි මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# බඩු බාහිරාදිය විකිණීම්

**ගාල්ල මහෙස්ත්‍රාත් අධිකරණය**

ගාල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ වශයෙන් ඇති රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් පෑමක් නොකළ පහත සඳහන් භාණ්ඩ 2016.02.27 වැනි සෙනසුරාද පෙ. ව. 9.00 ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් දක්වන්නකු වේ නම්, වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත එදින වෙන්දේසිය පැවැත්වීමට පෙර භාණ්ඩ පරීක්ෂා කළ හැකි ය.

04. අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ පූර්ණ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිලදී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා ම එවෙලේ ම මුදල් ගෙවා එකී භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

06. භාණ්ඩ ගැණුම්කරුවන් ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතු ය.

මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
ගාල්ල.

2016 ජනවාරි මස 13 වැනි දින,
ගාල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසි නඩු භාණ්ඩ ලැයිස්තුව**

| | | |
|---|---|---|
| 01. | යතුරු ලියන | 21 |
| 02. | සිටුවන විදුලි පංකා | 05 |
| 03. | සිවිලිත් විදුලි පංකා | 07 |
| 04. | බිත්ති විදුලි පංකා | 01 |
| 05. | සැලුන් දොර | 01 |
| 06. | ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණයේ අතිරේක මහෙස්ත්‍රාත් අධිකරණයේ ඉවත් කළ දොරවල් | 02 |
| 07. | වීදුරු බෝතල් තොගයක් | |
| 08. | ප්ලාස්ටික් බූලි තොගයක් | |
| 09. | 84606 ලිට්‍රෝ වර්ගයේ නිල් පාට ගෑස් සිලින්ඩරය | 01 |
| | මළ බැඳී ඇති ලිප් 04 ගෑස් ලිප් | 01 |
| 10. | 44043 පතුල දිරාපත්ව ඇති ගෑස් සහිත ලාෆ් | |
| | වර්ගයේ ගෑස් සිලින්ඩර් | 01 |
| | රෙගියුලේටර් | 01 |
| 11. | 41065 ලාෆ් ගෑස් සිලින්ඩර | 01 |
| | මළ බැඳී ඇති රෙගියුලේටරය සහිත ගෑස් ලිප් | 01 |
| 12. | 38142 ලාෆ් වර්ගයේ ගෑස් සිලින්ඩර් | 01 |
| | මළ බැඳී ඇති ගෑස් ලිප් | 01 |
| 13. | 33208 මළ බැඳී ඇති ගෑස් ලිප් | 01 |
| | ගෑස් සිලින්ඩර් | 01 |
| 14. | 17777 ලාෆ් වර්ගයේ ගෑස් සිලින්ඩර් | 01 |
| 15. | 49859 ෂෙල් වර්ගයේ ගෑස් සිලින්ඩර් | 01 |
| | මළ බැඳී ඇති ගෑස් ලිප් | 01 |

02-40

# රජයේ නොවන දැන්වීම්

**2007 අංක 7 දරන සමාගම් පනත යටතේ කරනු ලබන දැන්වීමයි**

සමාගමේ නම : ලක්ප්‍රිය ටයර් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 107921
ලිපිනය : අංක 242/5, නුවර පාර, ඉදිගහමුල හංදිය, කිරිල්ලවල, කඩවත.

02-48

---

**නිවේදනයයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 244 (3) වගන්තිය යටතේ නිවේදනය

ප්‍රයිම් ලෑන්ඩ්ස් රෙසිඩන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ් එහි මුළුමනින් ම පරිපාලිත සමාගම් වන ප්‍රයිම් හෝම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ලීවිං හෝම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමග 2016 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2007 අංක 07 දරන සමාගම් පනතේ 242 (1) වගන්තිය යටතේ ඒකාබද්ධ වී ඇති බවත් ඒකාබද්ධ කිරීමේ සහතිකය සමාගම් රෙජිස්ට්‍රාර් විසින් 2007 අංක 07 දරන සමාගම් පනතේ 244 (1) වගන්තිය ප්‍රකාර නිකුත් කර ඇති බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒකාබද්ධ කරන ලද සමාගමේ නම : ප්‍රයිම් ලෑන්ඩ්ස් රෙසිඩන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ඒකාබද්ධ කරන ලද සමාගමේ
ලියාපදිංචි ලිපිනය : අංක 75, ඩී. එස්. සේනානායක මාවත, කොළඹ 08
ඒකාබද්ධ කළ දිනය : 2016 ජනවාරි මස 01
ඒකාබද්ධ කරන ලද සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 7540

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රයිම් ලෑන්ඩ්ස් රෙසිඩන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2016 ජනවාරි 12.

02-56

### ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කිරීම

පන්නිපිටිය, පැලැන්වත්ත පාරේ, අංක 139/1 හි පදිංචි විජේසූරිය ආරච්චිගේ දෙන් සැම්සන් වන මා විසින් බොරලැස්ගමුව, එගොඩවත්ත, පළමු පටුමගෙහි පදිංචි ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. එස්. ජයවර්ධන විසින් සහතික කරන ලදුව, පිළියන්දල, හොරණ පාරේ අංක 181 හි පදිංචි නම්බිගේ දෙන් සුනිල් යමුනා අබේරත්න වෙත ප්‍රදානය කරන ලද අංක 2430 දරන ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ එහි පොදු මහජනතාව වෙත මෙයින් දන්වා සිටිමි.

02-57

---

### දැන්වීමයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ග්‍රෙෂන් කන්ස්ට්‍රක්ෂන් (පීවීටී) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 110673
ලියාපදිංචි කළ දිනය : 2015 දෙසැම්බර් 4
ලියාපදිංචි කාර්යාලය : අංක 56/1, ඩි සේරම් පාර, ගල්කිස්ස.

එස්. රාජකුලේන්ද්‍ර මිය,
නීතිඥ.

අංක 34/1, නෙල්සන් පෙදෙස,
වැල්ලවත්ත,
කොළඹ 06
(සමාගම් ලේකම්)

02 - 70

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

කඩවත, ඉහල බියන්විල, අංක 227/ඒ දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 693381460 V හිමි මැවැල්ල අබේරුවන්ගේ හේමචන්ද්‍ර අබේරුවන් වන මම කැළණිය, පෙතියාගොඩ, මැවැල්ල පාර, අංක 365/30 දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 651431905 වී හිමි මැවැල්ල අබේරුවන්ගේ සෙනරත් අබේරුවන් මහතා මගේ ඇටෝර්නි බලකරු වශයෙන් පත් කරන ලද ටී. ඒ. ධම්මික ගෝමිස් ප්‍රසිද්ධ නොතාරිස්තැනගේ අංක 4265 සහ 2012 සැප්තැම්බර් මස 04 වැනි දින දරන ඇටෝර්නි බලය මෙයින් අවලංගු කරන බවත් එය තවදුරටත් වලංගු සහ බල සහිත නොවන බවත් මෙයින් ප්‍රකාශ කරමි.

මැවැල්ල අබේරුවන්ගේ හේමචන්ද්‍ර අබේරුවන්.

02-114

---

### ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ලුණුවිල, කිරිමැටියාන, දබරේරා වත්ත, අංක 145 දරන තැන පදිංචි (විදේශ ගමන් බලපත්‍ර අංක එම් 2225541 හිමි) වර්ණකුල ආදිත්ත අර්සනිල ඉට්ට ප්‍රියන්ත රංජන් තමෙල් සහ (විදේශ ගමන් බලපත්‍ර අංක එන් 2132599 හිමි) රතුගමගේ නීටා ග්‍රේස් සුජාතා ප්‍රනාන්දු වන අප විසින් ලුණුවිල, කිරිමැටියාන, දබරේරා වත්ත, අංක 145 දරන තැන පදිංචි (ජා. හැ. පත් අංක 462284403 වී හිමි) වර්ණකුලආදිත්ත අර්සනීලඉට්ට පීටර් තමලේ වෙත පවරන ලද, පිලීෂියන් ප්‍රනාන්දුපුල්ලේ ප්‍රසිද්ධ නොතාරිස් විසින් සකස් කර 2008.09.12 දින ඉතාලියේ රෝමයේ දී අත්සන් කළ විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරනු ලබන බවත්, මින් ඉදිරියට එම ඇටෝර්නි බලපත්‍රය මගින් කරනු ලබන කිසිදු කටයුත්තක් සම්බන්ධව අපගේ වගකීමක් නොමැති බවත් මෙයින් ප්‍රකාශ කරමු.

වර්ණකුලආදිත්ත අර්සනිල ඉට්ට ප්‍රියන්ත රංජන් තමෙල්,
රතුගමගේ නීටා ග්‍රේස් සුජාතා ප්‍රනාන්දු.

02 - 115

---

### 2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 09 වගන්තිය යටතේ කරනු ලබන දැනුම් දීමයි

වර්ෂ 2016.01.08 වැනි දින ජේම්සික්ස් ජෙම්ස් ඇන්ඩ් ජුවෙලරි (පීවීටී) එල්ටීඩී නමින් සමාගමක් කොළඹ 03, ඇල්ෆ්‍රඩ් හවුස් ගර්ඩින්ස්, අංක 15/1/1 හි සංස්ථාගත කර ඇති බවත්, එකී සමාගමේ ලියාපදිංචි අංකය පී වී 111103 බවත් ශ්‍රී ලංකාවාසී ජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ත්‍රී එම් ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

02-116

---

### 2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 09 වගන්තිය යටතේ කරනු ලබන දැනුම් දීමයි

වර්ෂ 2012.06.26 දින හරසර ලංකා ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් නමින් සමාගමක් අනුරාධපුර, මෛත්‍රීපාල සේනානායක මාවත, අංක 521/22 හි සංස්ථාගත කර ඇති බවත්,එකී සමාගමේ ලියාපදිංචි අංකය පීවී 86776 බවත් ශ්‍රී ලංකාවාසී ජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ත්‍රී එම් ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

02-117

### සමාගම් නාමය වෙනස් කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ නාමය 2015.11.23 වැනි දින සිට වෙනස් කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

(1) සමාගමේ පූර්ව නාමය : වෙලීනා කැපිටල් කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
(2) සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 68561
(3) සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 05/21, සුලෙයිමන් ටෙරස්, කොළඹ 05
(4) සමාගමේ නව නාමය : වෙලිනා කැපිටල් කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්

එම්. එම්. විජිත මනම්පේරි,
සමාගම් ලේකම්.

02-118

### සමාගම් නාමය වෙනස් කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම එහි නාමය 2015.12.28 වැනි දින සිට වෙනස් කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

(1) සමාගමේ පූර්ව නාමය : වෙලීනා ඊ ත්‍රී එක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
(2) සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 100237
(3) සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : 26 වන මහල, නැගෙනහිර මහල, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, ඇචිලන් චතුරශ්‍රය, කොළඹ 01
(4) සමාගමේ නව නාමය : සී ඊ ත්‍රී එක්ස් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්

ත්‍රී එම් ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

02-119

### 2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 09 වගන්තිය යටතේ කරනු ලබන දැනුම් දීම

වර්ෂ 2015.12.22 වැනි දින බ්ලූ කිංඩම් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් නමින් සමාගමක් කොළඹ 03, ශාන්ත අන්තෝනි මාවත, ලකී ප්ලාසා හි අංක 8/2 හි සංස්ථාගත කර ඇති බවත්, එකී සමාගමේ ලියාපදිංචි අංකය පී වී 110701 බවත් ශ්‍රී ලංකාවාසී ජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ත්‍රී එම් ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

02-120

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ගාල්ල, එලියට් පාර, අංක 179 පදිංචි රෝලන්ඩ් නිශාන්ත මුදලිගේ වන මම මාගේ නීත්‍යානුකූල ඇටර්නි බලකාරිය වශයෙන් දඹගේ සන්ධ්‍යා නිලූෂි ධම්මිකා ප්‍රනාන්දු පත්කරන්නට යෙදුනු කුමුදු නානායක්කාර ප්‍රසිද්ධ නොතාරිස්තැනගේ අංක 576 හා 2011.12.30 දිනැති ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බව සියල්ලෝ ම මෙයින් දැනගනිත්වා.

රෝලන්ඩ් නිශාන්ත මුදලිගේ.

02-149

---

### දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සීමිත වගකීම් සහිත සමාගම 2015 අගෝස්තු මස 19 වැනි දින සංස්ථාගත කරන ලද බැව් මෙයින් දන්වා සිටිමු.

සමාගමේ නම : කොමන් වෙල්ත් කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 64595
ලියාපදිංචි කළ දිනය : 2008.07.01
ලියාපදිංචි ලිපිනය : අංක 75, වෝඩ් පෙදෙස, කොළඹ 07.

ජෝසප් සෙක්‍රටේරියල් සර්විසස් (පුද්ගලික) සමාගම,
සමාගමේ ලේකම්වරු.

2015 අගෝස්තු මස 26 වැනි දින.

02-155

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : කල්පිටිය ලැගුන් රිසෝට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත කළ දිනය : 2015 දෙසැම්බර් මස 02 වැනි දින
සමාගමේ අංකය : පී වී 110212
ලියාපදිංචි ලිපිනය : අංක 59, ග්‍රෙගරිස් පාර, කොළඹ 07

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

පී. ආර්. සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අධ්‍යක්ෂ.

02-176

---

### ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තිය අනුව කරනු ලබන නිවේදනයයි

සමාගමේ නම : සෙයිටුන් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 110097,
සංස්ථාගත කළ දිනය : 2015.11.27
ලියාපදිංචි ලිපිනය : අංක 263, ගාලු පාර, කොළඹ 03.

එස්. ඒ. මහරූෆ්,
ලේකම්.

02-192

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි

සමාගමේ නම : කෝනර් ස්ටෝන් කොමියුනිටි ෆවුන්ඩේෂන්
සමාගමේ අංකය : ජී ඒ 3127
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 374, ආනන්තන් පාර, උතයනකර් වෙස්ට්, කිලිනොච්චි
සංස්ථාගත කිරීමේ දිනය : 2016.01.05

බ්‍රිලියන්ට් ප්‍රොමෝටස් ඇන්ඩ්
කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

02-194/1

---

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි

සමාගමේ නම : නොදර්න් ප්‍රොවින්ස් කොන්සෝටියම් ඔෆ් ඕගර්නයිසෙෂන් ෆෝ ඩිෆරන්ට්ලි ඒබල්ඩ්
සමාගමේ අංකය : ජී ඒ 3131
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 126, නුවර පාර, ආනන්තපුරම්, කිලිනොච්චිය
සංස්ථාගත කිරීමේ දිනය : 2016.01.12

බ්‍රිලියන්ට් ප්‍රොමෝටස් ඇන්ඩ්
කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

02-194/2

---

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි

සමාගමේ නම : ෆියුචර් සිලෝන් මීඩියා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 111221
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 27, ජයා රෝඩ්, කොළඹ 06
සංස්ථාගත කිරීමේ දිනය : 2016.01.12

සමාගම් ලේකම්වරු.

02-194/3

---

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි

සමාගමේ නම : ෂොප් ස්ටයිල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 111304
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 7 - 2/9, ඔර්සාඩ් කොම්පිලෙක්ස් ගාලු පාර, කොළඹ 06
සංස්ථාගත කිරීමේ දිනය : 2016.01.14

බ්‍රිලියන්ට් ප්‍රොමෝටස් ඇන්ඩ්
කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

02-194/4

---

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි

සමාගමේ නම : සුබ්‍රා ෆාම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 111125
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : 8 වැනි මයිල් පෝස්ට්, මන්නාර් පාර, පුවරසංකුලම, වවුනියා
සංස්ථාගත කිරීමේ දිනය : 2016.01.08

බ්‍රිලියන්ට් ප්‍රොමෝටස් ඇන්ඩ්
කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

02-194/5

---

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි

සමාගමේ නම : සිලෝන් බිස්නස් නෙට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 111270
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 3, ඩබ්. ඒ. සිල්වා මාවත, කොළඹ 06
සංස්ථාගත කිරීමේ දිනය : 2016.01.13

බ්‍රිලියන්ට් ප්‍රොමෝටස් ඇන්ඩ්
කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

02-194/6

### නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි

සමාගමේ නම : වී. එෆ් මාර්කටිං (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 97744
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 55, ඩින්ස්ටන් පිලෙස්, කොළඹ 03.
සංස්ථාගත කිරීමේ දිනය : 2014.03.24

බ්‍රිලියන්ට් ප්‍රොමෝටස් ඇන්ඩ් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

02-194/7

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ජනරජයේ පිළියන්දල සිද්ධමුල්ල පළමු මග අංක 32/බී පදිංචි බන්නැහැක මුදියන්සේලාගේ සරත් ගාමිණී බන්නැහැක වන මම ප්‍රසිද්ධ නොතාරිස් රුක්මල් ජේ. ද අල්විස් මහතා මගින් 2015.01.23 වැනි දින සහතික කරන ලද අංක 1421 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් පිළියන්දල සිද්ධමුල්ල පළමු මාවතේ, අංක 32/බී ස්ථානයේ පදිංචි විතාන පතිරන්නැහැලාගේ වානා තුෂාරි සමරසිංහට පැවරූ විශේෂ ඇටෝර්නි බලපත්‍රය 2015.10.15 වැනි දින සිට බල පවත්වන පරිදි අවලංගු කරන බව ශ්‍රී ලංකා ජනරජයටත්, ලංකාවාසී ජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

බන්නැහැක මුදියන්සේලාගේ සරත් ගාමිණී බන්නැහැක.

02-215

### මහජනතාව වෙත දැනුම් දීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත පුද්ගලික සමාගම 2015 දෙසැම්බර් මස 14 වැනිද ස්ථාපිත කළ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : ඒ වී ඩී ලංකා (පුද්ගලික) සමාගම
ලියාපදිංචි අංකය : පී වී 110348
ලියාපදිංචි ලිපිනය : අංක 24/13, විජයබා මාවත, නාවල, නුගේගොඩ.

සමාගම් ලේකම්.

02-201

---

### නිවේදනය

පහත සඳහන් සමාගමෙහි නම වෙනස් කිරීම පිළිබඳව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ මෙසේ නිවේදනය කරනු ලැබේ.

නම : ග්‍රීන් සිටි එස්ටේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී බී 3852 පී වී
ලියාපදිංචි ලිපිනය : අංක 100/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය
තත්ත්වය වෙනස්වීමෙන් පසුව සමාගමේ නම : රීගල් රිකවරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එල්ඕඑල්සී කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

2016 ජනවාරි මස 14 වැනි දින.

02-202

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

වර්ෂ 2011 ක් වූ ජූලි මස 10 වන දින රෝමයේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ නියෝජිතයෙකු සහ සාමදාන විනිශ්චයකරවරයෙකු වූ ඩී. එම්. පෙරේරා මහතා විසින් සහතික කොට බත්තරමුල්ල රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ අංක 7453 දරන දෛනික පොතේ ලියාපදිංචි කොට, අංක 54, ජුසේවාස් මාවත, පුත්තලම යන ලිපිනයේ පදිංචි හා අංක 768620938V දරන ජාතික හැඳුනුම්පත සතුව සිටින කරුණානායක පතිරැන්නහැලාගේ සුබෝධිනී කරුණානායක නැමැත්තියට ලබා දෙන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය 2016.01.11 දින සිට ක්‍රියාත්මක වන පරිදි බලරහිත කොට අවලංගු කරන ලද බව ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුවටත්, මහජනතාවටත් පුත්තලම ජුසේවාස් මාවතේ, අංක 54 ලිපිනයේ පදිංචි හා අංක 733410582 V දරන ජාතික හැඳුනුම්පත සතුව සිටින අලහකෝන් පතිරැන්නහැලාගේ ඉන්දික තුෂාර වන මම මෙයින් දන්වා සිටිමි.

එස්. අයි. එම්. හිස්මි,
නීති උපදේශක.

02-07

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

| *සමාගමේ නම* | *ලියාපදිංචි අංකය* | *ලියාපදිංචි කළ දිනය* | *ලියාපදිංචි කාර්යාලීය ලිපිනය* |
|---|---|---|---|
| ස්කිල්ස් ඇසෙස්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 111041 | 2016.01.06 | අංක 22, ඔස්ටින් පෙදෙස, කොළඹ 08 |
| ස්කිල්ස් කන්සල්ටන්සි සිල්ක් රූට් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 111167 | 2016.01.11 | අංක 22, ඔස්ටින් පෙදෙස, කොළඹ 08 |

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස් ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

02-200

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම

**යූනියන් බැන්ක් ඔෆ් කළම්බෝ පී එල් සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීමයි

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කොට්ඨාසය තුළ දකුණු පිටිගල් කෝරළයේ, යටකලන් පත්තුවේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 530 ඒ දරන මට්ටකොටුවැල්ල ග්‍රාම නිලධාරි වසම තුළ දකුණු තෝඩුවාව ගමේ පිහිටි සියඹලාගහවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඩබ්ලිව්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 3983 සහ 2010.03.19 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙද වෙන් කරන ලද අංක 1 දරන ඉඩම් කැබැල්ල. මෙම දේපළ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කේ 24/28ඒ දරන වෙලුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

*ප්‍රමාණය* : අ. 0, රූඩ් 2, පර්. 21.40) රූඩ් දෙකයි පර්චස් විසි එකයි දශම හතරයි බිංදුවක් විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි සෑම සියලු දේ සමග වේ.

වෙන්නප්පුව ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ශ්‍රීනා නිලුක්ෂි තිසේරා විසින් සහතික කරන ලද අංක 1388 සහ 2013.08.01 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි ඉහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම් දේපළ සහ පරිශ්‍රය වර්ණකුලසූරිය කැළුම් දීමන්ත ප්‍රනාන්දු සහ ජයසූරිය අලංකාරගේ ඇනිස්ටස් ලොයොලා පෙරේරා බන්ධනදයින් වශයෙන් කොළඹ 03, ගාළු පාරේ අංක 64 හි පිහිටි යූනියන් බැන්ක් ඔෆ් කළම්බෝ පී එල් සී නමට උකස් කොට ඇපයට තබා ඇති උකස් බැඳුම්කරය මගින් සුරක්ෂිත කරන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම වර්ණකුලසූරිය කැළුම් දීමන්ත ප්‍රනාන්දු සහ ජයසූරිය අලංකාරගේ ඇනිස්ටස් ලොයොලා පෙරේරා ණය ගැණුම්කරුවන් වශයෙන් සහ පැහැර ඇති හෙයින්, යූනියන් බැන්ක් ඔෆ් කළම්බෝ පී එල් සී විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව, 2016ක් වූ පෙබරවාරි මස 23 වැනි දින පෙ. ව. 10.30 ට අදාළ දේපළ පිහිටි ස්ථානයේ දී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - කොළඹ සිට පුත්තලම පාරේ මාරවිල සිට කි. මී. 5.5ක් පමණ ගමන් කළ විට (59 කි. මී. කණුව පසුවී මීටර 800ක් පමණ ගිය විට) මහවැව හන්දිය හමුවේ. එතැන් සිට වමට ඇති මහවැව - තෝඩුවාව පාරේ කි. මී. 3.4ක් පමණ ගමන් කළ විට අදළ දේපළට පිවිසිය හැක. එම දේපළ පාරේ දකුණු පැත්තේ පිහිටා ඇත.

*ගෙවීම් කළ යුතු ආකාරය.* - විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
02. ඉතිරි සියයට අනුව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත යූනියන් බැන්ක් ඔෆ් කළම්බෝ පී එල් සී හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුනුම් මිලෙන් සියයය දෙකයි දශම පහයි (2.5%)
04. පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
05. ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
06. ලිපිකරු හා සෝෂක වේතනය රු. 1,000,
07. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 2,000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිළධාරින්ගෙන් විමසන්න. නීති දෙපාර්තමේන්තුව, යූනියන් බැන්ක් ඔෆ් කළම්බෝ පී එල් සී, අංක 64, ගාළු පාර, කොළඹ 03. දුරකථන අංක 011- 2374100.

ත්‍රිවංක සහ සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ සහ
උසාවි කොමසාරිස්වරු.
කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා
අධිකරණය බලයලත් වෙන්දේසිකරුවෝ
රාජ්‍ය සහ වාණිජ බැංකු

අංක 200, හල්ස්ඩ්‍රොෆ් වීදිය, කොළඹ 12,
දුරකථන අංක : 077 - 3181891.

02-197

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.**
**පරණ යොන් වීදිය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දකුණු අළුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ වත්තල ප්‍රාදේශීය සභාවේ හැඳල උපකාර්යාල සීමාවේ හැඳල පිහිටි වැලිඅමුණ පාරේ වරිපනම් අංක 85/5 (බලයලත් මිනින්දෝරු වී. එස්. සුන්දරම් විසින් 1960 මාර්තු මස 3 වැනි දින සාදන ලද පිඹුරු අංක 444 දක්වෙන ලොට් 65 හි කොටසක්) දරන කැටකැලගහවත්ත සහ දවටගහවත්ත හැඳල තෝටම් හෙවත් අච්චි ඉඩම බෙද වෙන්කොට ඇති බලයලත් මිනින්දෝරු හියු ආර්. සමරසිංහ විසින් 2005 ජූලි මස 26 වැනි දින සාදන ලද අංක 4459 දරන පිඹුරේ ලොට් 1 දරන ප්‍රමාණය ඃ අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් හතරයි දශම හයයි හතක් (අ. 1 රූ. 2 පර්. 4.67) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි සියලු දේත් සමග වේ. පහත විස්තර සඳහන් ඉඩම් කොටස මතුපිටින් හා ඒ දිගේ එහා මෙහා යෑමේ අයිතිය සමඟ වේ.

හැඳල වැලිකුඹුර ග්‍රාමයේ වැලිඅමුණ පාරේ පිහිටි හෙන්දල් තෝටම් හෙවත් අච්චි පොන්සාලේ වත්ත නමින් ද හැඳින්වෙන ඉඩම බෙද වෙන්කොට ඇති බලයලත් මිනින්දෝරු වී. සිවා සුන්දරම් විසින් 1960 මාර්තු මස 03 වැනි දින සාදන ලද අංක 444 දරන පිඹුරේ ලොට් 55 දරන ප්‍රමාණය රූඩ් දෙකයි පර්චස් එකොළහයි දශම තුනයි හතක් (අ. 0 රූ. 2 පර්. 11.37) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි සියලු දේත් සමග වේ.

සේෆ්ටි ඉන්ටර්නැෂනල් නමින් තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන කාසීරාජරත්නම් සිත්තම්බලම් ණයකරු වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ වර්ෂ 2016ක් වූ මාර්තු මස 01 වැනි දින පෙ. ව. 10.30 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2015.05.22 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2015.10.19 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2016.02.05 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2016.02.08 දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - කොළඹ සිට මීගමුව පාර ඔස්සේ හැඳල හංදියට පැමිණ එතැනින් වමට හැරුණු විට තැපැල් කාර්යාලය පැත්තේ ඇති ඇලකන්ද පාරේ කි. මී. 2ක් ගමන්කර වමට හැරුණු විට වැලිඅමුණ පාර හමුවේ. එම පාරේ මීටර් 500ක් පමණ ගොස් වමට හැරුණු විට එක්සත් මාවත හමුවේ. එම මාවතේ මීටර් 200ක් පමණ ගියවිට අදාළ දේපළ වම්පසින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* -විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%), (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%), (04) නොතාරිස් ගාස්තුව රු. 2,000, (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්, (07) ගැණුම්කරු විසින් අකාලික වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි, (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ පරණ යොන් වීදිය ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්,
අංක 200, 2 වන මහල උසාවි පාර, කොළඹ 12
දුරකථන/ෆැක්ස් 011- 2445393
ඊමේල් : senaservice@sltnet.lk

ජ්‍යෙෂ්ඨ කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී,
අංක 442/ඒ,
පරණ යොන් වීදිය, කොළඹ 12.
දුරකථන අංක : 011- 2345579/011 - 2345554/011- 2345595
ෆැක්ස් අංකය : 011 - 2345575.

02-198

---

**මහජන බැංකුව - මීගමුව ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මීගමුව මහ නගර සභා සීමාවේ පලඟතුරේ ගමේ පිහිටි ප්ලෙසන්ට් විලා නමැති වරිපනම් අංක 71 දරන රූඩ් 01, පර්. 17.10ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2016.02.23 වැනි දින පෙ. ව. 11.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපළ පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

රජයේ ගැසට් පත්‍රයේ 2015.07.03 දින ද, ඩේලි නිව්ස්, දිනමිණ සහ තිනකරන් පුවත්පත්වල 2015.06.18 දින ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - මීගමුව නගරයේ සිට හලාවත පාරේ කි. මී. 3 1/2 පමණ ගිය විට හමුවන කට්ටුව වංගුවෙන් වමට ඇති පලඟතුර පල්ලිය පාරේ මීටර් 600ක් පමණ ගිය විට බේකරියක් හමුවේ. එම බේකරිය ඉදිරිපිටින් ඇති අඩි 15 පළල පාරේ මීටර් 40ක් පමණ ගිය විට මෙම දේපළට ප්‍රවේශ විය හැක.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ, සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය ඃ -

1. ගැණුම් මිලෙන් 10% ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත කළමනාකරු මහජන බැංකුව, ජාඇල ශාඛාව වෙත ගෙවිය යුතු ය.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් ආදාළ විස්තර පහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ප්‍රාදේශීය කළමනාකරු, මහජන බැංකුව, ගම්පහ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, අංක 131, නුවර පාර, බැලුම්මහර, මුදුන්ගොඩ.

දුරකථන අංකය : 033 - 2222325, 033-2225008,
033 - 2231901,
ෆැක්ස් අංකය : 033 - 2226165, 033 - 2226741.

''ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි''

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 124 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593,
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371.
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක : 011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176.
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

02-182

---

### ප්‍රසිද්ධ වෙන්දේසියක්

කැළණිය ගෝනවල මගුරුවිල පාරේ වරිපනම් අංක 122/81 දරන පරිශ්‍රයේ පිහිටි ගොඩනැගිල්ලක් සහිත පර්චස් 21.20 ක් විශාලැති අගනා දේපළ

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත ගෝනාවල පිහිටා ඇත්තාවූ ද, මගුරුවිල පාරේ, වරිපනම් අංක 122/81 දරන්නාවූ ද, උතුරින් සමගි මාවතින්, නැගෙනහිරින් හෙට්ටිආරච්චි සහ ඩබ්ලිව්. ජී. තිලකරත්න විසින් හිමිකම් දක්වා සිටින ඉඩමෙන්, දකුණින් පාරෙන් සහ අංක 2 බිම් කැබැල්ලෙන් සහ බස්නාහිරින් අංක 2 බිම් කැබැල්ලෙන් හා සමගි මාවතින් මායිම්වූ ද, බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ජී. සුනිල් සෝමසිරි විසින් සාදන ලද අංක 242 හා 2007 නොවැම්බර් මස 10 වැනි දින දරන පිඹුරු ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් විසි එකයි දශම දෙකයි බිංදුවක් (අ. 0 රූ. 0 පර්. 21.20) හෝ හෙක්ටයාර් 0.0536 කින් යුක්තවූ ද, ''දිවගලකුරුඳුවත්ත'' යනුවෙන් හඳුන්වනු ලබන එකී ඉඩමෙන් එකී අංක 242 දරන පිඹුරේ නිරූපිත අංක 1 බිම් කැබැල්ල වශයෙන් සළකුණු කරන ලද බෙදා වෙන් කරන ලද හා නිශ්චිත මුළු ඉඩම් කැබැල්ල හා ඒ මත පිහිටි ගහකොළ, ගොඩනැගිලි, වැව්ලි හා වෙනත් සියලු දේ ද සමග වේ.

ඉහත කී ගෝනාවල පිහිටා ඇත්තාවූ ද, ඉහත අංක 01 බිම් කැබැල්ල වශයෙන් විස්තර කර ඇති බිම් කැබැල්ල පහත සඳහන් ඉඩමේ බෙද වෙන්කරන ලද නිශ්චිත කොටසක් වේ.

උතුරින් එම් බිම් කැබැල්ලෙන්, නැගෙනහිරින් අංක 131 හා 138 බිම් කැබැලිවලින් දකුණින් එන් බිම කැබැල්ලෙන් හා බස්නාහිරින් එම් බිම කැබැල්ලෙන් මායිම්වූ ද, බලයලත් මිනින්දෝරු වී. ඒ. එල්. සේනාරත්න විසින් සාදන ලද අංක 3056 හා 1964 නොවැම්බර් මස 30 වැනි දින දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් විසි හයයි දශම දෙකකින් (අ. 0, රූ. 0 පර්. 26.2) යුක්තවූ ද, කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 707/76 වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත්තාවූ ද, ''දිවිගලකුරුඳුවත්ත'' යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමේ එකී අංක 3056 දරන පිඹුරේ නිරූපිත අංක 130 බිම් කැබැල්ල වශයෙන් සළකුණු කරන ලද මුළු ඉඩම් කැබැල්ල වේ.

(අ) රු. 940,626.35ක් රු. 63,046.00ත් ලෙස සමස්ථ රු. 1003,672.35 ක මුදල සහ රු. 940,626.35ක් වූ එකී මුදල මත 2011 මාර්තු මස 19 වැනි දින සිට ඒ මුදල සම්පූර්ණයෙන් හා අවසාන වශයෙන් බේරුම් කරනු ලබන තෙක් වර්ෂයකට 14% ක අනුප්‍රමාණයක් අනුව වූ වැඩිදුර පොළියක් ද, (ආ) රු. 205,000.00 ක මුදලක් ද නඩු ගාස්තු සහ වෙන්දේසිකරුගේ ගාස්තු ද, අයකර ගැනීම පිණිස (1) ගෝනවල, පට්ටිවල හන්දියේ අංක 82/2, දරන ස්ථානයේ සහ ගෝනවල, කුරුදුවත්තේ අංක 85/5 දරන ස්ථානවල ''මින්දික එන්ටර්ප්‍රයිසස්'' යන නාමය අභිධානය හා ව්‍යාපාර නාමය යටතේ තනි අයිතිකරු වශයෙන් ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලැබේ. චම්මිල චන්තක ජයසූරිය (2) ගෝනවල, අංක 85/5, කුරුඳුවත්ත, යන ස්ථානයේ පදිංචි චාන්දනී පෙරේරා නොහොත් බුලත්සිංහලගේ චාන්දනී පෙරේරා අයට විරුද්ධව කොළඹ 01, බ්‍රිස්ටල් වීදියේ අංක 21 හි සහ කඩුවෙල, අවස්සාවේල්ල පාරේ අංක 508/5 දරන ස්ථානයේ කඩුවෙල ශාඛාව යනුවෙන් සඳහන් කරනු හා හඳුන්වනු ලබන ශාඛා කාර්යාලයක් හා ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී විසින් නුගේගොඩ දිසා අධිකරණයේ පවරන ලද අංක එම්බී/068/13 දරන නඩුවෙන් මා වෙත පවරන ලද බලය මත ඉහත සඳහන් කළ දේපළ වර්ෂ 2016ක් වූ මාර්තු මස 23 වැනි දින පෙරවරු 10.30 කණිසමට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට ප්‍රවිශ්ඨ වන මාර්ගය*.- කොළඹ කොටුවේ සිට නුවර පාරේ කි. මී. 4ක් පමණ ගමන් කර දකුණට හැරී බියගම පාරේ කැලණිය පංසල පසුකර බොල්ලෑගල මංසන්දිය දක්වා ගමන් කර වමට හැරී විජයරාම පාරේ කි. මී. 1.1ක් පමණ ගමන් කර නැවත වමට හැරී කරුණා පාරේ මීටර් 700ක් පමණ ගමන් කිරීමෙන් මුදිත පාරට සහ සමගි මාවතට මායිම්ව මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*. - වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් ඒ අවස්ථාවේ ම වෙන්දේසිකරුට ගෙවිය යුතු ය. (1) ගැණුම මිලෙන් 25%ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, (3) වෙන්දේසිකරුගේ වෘත්තිය ගාස්තු වශයෙන් 2.5%ක් ද, (4) වෙන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 10,000 ක මුදලක් ද, වන අතර ගැණුම් මිලේ පරිශේෂය වන 75% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගරු අධිකරණයේ මෙම නඩුවේ බැරට තැන්පත් කළ යුතු ය.

වැඩිදුර විස්තර සඳහා කොළඹ 01, ජනාධිපති මාවතේ, අංක 41 දරන ස්ථානයේ නීතිඥවරුන් හා නොතාරිස්වරුන් වන ජුලියස් ඇන්ඩ් ක්‍රිසි සමාගමෙන් විමසන්න. දුරකථන අංක 011 2422601 දිගුව 408.

පී. කේ. ඊ.සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 011 28736565, 0777 - 672082,
ෆැක්ස් අංකය : 011 2871184.

02-191

---

HNB 224 -14 (1)

**හැටන් නැෂනල් බැංක් පීඑල්සී - හෙට්ටිවීදිය ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හල්ලොලුව විසින් සහතික කරන ලද්ද වූ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්ද වූ ද 2010.12.29 වැනි දින සහ අංක 2780 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම පෙරියසාමි මහේෂ්වරන් යන අය ණයකරු වශයෙන් පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2016 ක් වූ පෙබරවාරි මස 26 වැනි දින ප.ව. 2.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළ.- බස්නාහිර පළාතේ, (නමුත් කොළඹ ලියාපදිංචි කොට්ඨාසය තුළ) ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ, වත්තල මාබෝලේ නගර සභා සීමාව තුළ වසම් අංක 05, වත්තල, ගල්වැටිය පිහිටි ශ්‍රී වික්‍රම පටුමගේ වරිපනම් අංක 19 දරන කෝන්ගහවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඊ. ජේ. බී. පෙරේරා විසින් මැන සාදන ලද 2006 ජුනි මස 07 වැනි දින අංක 8992 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් එක්ස් දරන ඉඩම සමඟ ගොඩනැගිලි සහ එහි ඇති සියලු දේත්. විශාලත්වය පර්චස් දෙලහයි දශම නවයයි අට (අ. 0, රූ. 0, පර්. 12.98) වේ.

